# 21 පාඩම - මිණි ගණ සදෙස් වැනුමෙන්

**සන්දේශයක් යනු කුමක් ද ? සන්දේශයක ප්‍රධාන ලක්ෂණ මොනවා ද? සන්දේශ කාව්‍යයේ ආරම්භය හා විකාශනය කෙසේ සිදු වූවක් ද? මේ ගැන අපි කෙටියෙන් විමසා බලමු.**

සන්දේශයක් යනු පණිවිඩයකි. හසුන, අස්න, ආරංචිය, ආඥාව යන අර්ථ සඳහා ද මේ වචනය යෙදේ.

## සන්දේශ ලක්ෂණ

- ප්‍රේෂක - යවන්නෙක්
- කාරක - ගෙනයන්නෙක්
- ග්‍රාහක - ලබන්නෙක්
- සන්දේශය - කිවයුත්තක්

මෙම ලක්ෂණ සතරින් යුක්ත නම් සන්දේශයක් ලෙස දැක්විය හැකිය. අතීතයේදී සතුන් මෙන්ම අචේතනික වස්තූන් අත ද මේ පණිවිඩ යැවීම සිදු වී ඇත. “සංස්කෘත මහා කවි කාලිදාසගේ ‘මේඝදූතය’ ” ප්‍රථම සන්දේශය ලෙස පිළිගැනේ.

**සන්දේශ කාව්‍ය පරිශීලනය කිරීමෙන් ඒවායේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ කිහිපයකි.**

- ✓ ප්‍රසිද්ධ පුරුෂයකු හෝ ස්ත්‍රියක එහි කතෘ නායකයා වීම.
- ✓ දූතයා උසස් වංශයකට අයත් වීම.
- ✓ ඉතිහාස කතාවකින් හෝ ආශිර්වාදයකින් ආරම්භ වීම.
- ✓ දූත වර්ණනය, අස්න, මාර්ග වර්ණනය මෙන්ම උදය, සැඳෑ, පුරවැනුම්, රජ වැනුම් ආදිය ඇතුළත් වීම.
- ✓ දූතයාට ආශිර්වාද කිරීම.

සිංහල සන්දේශ ඉතිහාසය ගම්පොළ යුගයේ ලියැවුණු මයුරය හා තිසරය සිංහල සන්දේශ සාහිත්‍යාවලියේ ප්‍රථම බීජ දෙක ලෙස සඳහන් කළ හැකිය.

දැනට විද්‍යාමාන සිංහල සන්දේශයන්හි ඉතිහාසය ප්‍රධාන කාල පරිච්ඡේද දෙකක් ලෙස දැක්වීමට පුළුවන්.

1. කෝට්ටේ යුගයේ අවසානය වන තෙක් ලියැවුණු සන්දේශ
2. කෝට්ටේ යුගයෙන් පසුව ලියැවුණු සන්දේශ

එම සන්දේශ අපි මෙසේ වගු ගත කරමු.

| සන්දේශය | යුගය | කතුවරයා | පද්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| මයුර සන්දේශය | ගම්පොළ යුගය | කවීශ්වර හිමි | 163 |
| තිසර සන්දේශය | ගම්පොළ යුගය | අඥාතය | 187 |
| පරවි සන්දේශය | කෝට්ටේ යුගය | ශ්‍රී රාහුල හිමි | 203 |
| කෝකිල සන්දේශය | කෝට්ටේ යුගය | ඉරුගල් කුලතිලක | 291 |
| සැලළිහිණි සන්දේශය | කෝට්ටේ යුගය | ශ්‍රී රාහුල හිමි | 211 |
| ගිරා සන්දේශය | කෝට්ටේ යුගය | අඥාතයි | 254 |
| හංස සන්දේශය | කෝට්ටේ යුගය | වීදාගම මෛත්‍රීය හිමි | 206 |

| සන්දේශය හා කාලය | දූතයා (කාරකයා) | ප්‍රතිග්‍රාහකයා | පණිවිඩය | ගමන් මග |
|---|---|---|---|---|
| මයුර සන්දේශය ක්‍රි. ව. 1385 - 1391 | මොණරා | උපුල්වන් දෙවි | බුවනෙකබා රජුගේ බිසව ඇතුළු පිරිස රැකදෙන ලෙස ඉල්ලීම. | ගඟ සිරිපුර සිට අත්තනගල්ල, කෝට්ටේ, බෙන්තොට, තොටගමුව, වැලිගම සිට දෙවුන්දර දක්වා. |
| තිසර සන්දේශය ක්‍රි.ව. 1409 – 1415 | හංසයා | උපුල්වන් දෙවි | පැරකුම්බා ඈපාණන් රැකදෙන ලෙස ඉල්ලීම. | දෙවිනුවර සිට වැලිගම, බෙන්තර, කළුතර සිට කැළණිය දක්වා. |
| පරවි සන්දේශය ක්‍රි.ව. 1430 - 1440 | පරවියා | උපුල්වන් දෙවි | පරාක්‍රමබාහු රජුගේ දෙටු දියණිය චන්ද්‍රවතී කුමරියට සැමියකු ලබා දීම. | ජයවර්ධනපුර සිට පානදුර, බෙන්තර හරහා දෙවුන්දර දක්වා. |
| කෝකිල සන්දේශය ක්‍රි.ව. 1440 - 1446 | කොවුලා | උපුල්වන් දෙවි | සපුමල් කුමාරයගේ බලය ස්ථිර කිරීම. | දෙවිනුවර, පැපිලියාන, මීගමුව, මුන්නේශ්වරම් හරහා යාපාපටුන දක්වා. |
| සැලළිහිණි සන්දේශය ක්‍රි.ව. 1450 | සැලළිහිණියා | විභීෂණ දෙවි | පැරකුම්බා රජුගේ දියණිය උලැබා දේවියට දරුවෙකු ලබා දීම. | කෝට්ටෙ ජයවර්ධනපුර සිට කැළණිය දක්වා. |
| ගිරා සන්දේශය ක්‍රි.ව. 1457 - 1465 | ගිරවා | රහල් හිමියන් විසින් නාථ දෙවියන් වෙත | පැරකුම්බා රජු හා බුදු සසුන රැක දීම. | ජයවර්ධනපුර මහා විහාරයේ සිට තොටගමුව දක්වා. |
| හංස සන්දේශය ක්‍රි.ව. 1457 - 1465 | හංසයා | වනරතන හිමි මගින් උපුල්වන් දෙවියන් මුල් කොට සමන්, බෝතිසල්, විභීෂණ ආදි දෙවියන් හට. | සතුරු උවදුරු මැඩ රජුගේ බලය රැක දීම. | ජයවර්ධනපුර සිට වෙළඳගොඩ හරහා කැරගල පද්මානතී පිරිවෙනට |

## කෝට්ටේ යුගයෙන් පසුව ලියැවුණු සන්දේශ

| සන්දේශය | යුගය | කතුවරයා | ගමන් මග | පද්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සැවුල් සන්දේශය | සීතාවක | අලගියවන්න මුකවෙටිතුමා | සීතාවක සිට සබරගමුව දක්වා | 204 |
| කැටකිරිලි සන්දේශය | මහනුවර | අතපත්තු මුකවෙටිතුමා | සමනල කන්දේ සිට සබරගමුව දක්වා | 103 |
| නීලකොබෝ සන්දේශය | මහනුවර | බරණගනිතුමා | සිටිනා මලුවේ සිට කතරගම දක්වා | 148 |
| දිය සැවුල් සන්දේශය | මාතර | ධම්මක්ඛන්ධ හිමි | කඹුරුගමුව සිට කතරගම දක්වා | 174 |
| කිරල සන්දේශය | මාතර | කිතලගම දේවමිත්ත | මහනුවර සිට ඇම්බැක්කේ දක්වා | 140 |

**මයුර සන්දේශය, පරවි සන්දේශය, හංස සන්දේශය හා සැලළිහිණි සන්දේශය පිළිබඳව මූලික තොරතුරු අපට වගුවෙන් ලබා ගත හැකිය. නියමිත පාඩමට අදාළ සැඳෑ වැනුම් පිළිබඳ අර්ථ විග්‍රහ පෙළ පොත ඇසුරින් අධ්‍යයනය කරන්න.**

**සන්ධ්‍යා වර්ණනයේ දී කතුවරුන් ඉර බැස යාමත් සඳ, තරු පායා ඒමත් පිළිබඳ අපූර්වත්වයෙන් විස්තර කරයි. එය එසේ වුවද සැලළිහිණි සදෙස් කරු වන තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ සැඳෑ වැනුම මධුර මනෝහර පද ලාලිත්‍යත්, අතිශය සජීවී වූ ස්වභාවික සෞන්දර්ය වර්ණනාත්, උපමා භාවිතයේ විචිත්‍රත්වයත්, වර්ණිත වස්තුවට උචිත සේ බස හැසිරවීමත්, පද සංඝටනයත්, ශබ්ධ මාධූර්ය තුළිනුත්, අනෙක් සදෙස් කරුවන්ට වඩා ප්‍රතිභා පූර්ණ කවීත්වයත් පැහැදිළිවම පෙන්නුම් කරයි.**

පිටු සැකසුම :- ඒ.වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා